ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

# ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## ජලය සහ සනීපාරක්ෂාව සඳහා වූ විශිෂ්ටතා මධ්‍යස්ථානය (CEWAS) සඳහා සේවා සැපයීම සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවෙකු බඳවා ගැනීම

**කොන්ත්‍රාත් අංකය : NWSDB/CEWAS/SERVICE/2024/05**

**ලංසුපත් භාරදීමේ අවසාන දිනය : 2024 අගෝස්තු 26 වන දින පෙ.ව. 10.00**

1. සභාපති, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාලු පාර, රත්මලාන, ජලය සහ සනීපාරක්ෂාව සඳහා වූ විශිෂ්ටතා මධ්‍යස්ථානය (CEWAS) සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවෙකු ලෙස සේවා සැපයීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අවශ්‍ය අවම සුදුසුකම්, පළපුරුද්ද සහ වැඩ විෂය පථය සම්බන්ධව සියලු විස්තර පහත සඳහන් සබැඳිය (Link) මගින් ලබාගත හැක.

**ව්‍යාපාර කළමනාකරු** - https://shorturl.at/9F0F4

3. සවිස්තර ලංසු පත්‍රිකා සමඟ TOR පත්‍රිකා ලබා ගැනීම සඳහා ලංසු අවසන් කරන දිනට පෙර සාමාන්‍ය කාර්යාල දිනවල පැය 09.30 සිට පැය 15.00 දක්වා ලිඛිත ඉල්ලීමක් සහකාර සාමාන්‍යාධිකාරී (ටෙන්ඩර් සහ කොන්ත්‍රාත්) වෙත ඉදිරිපත් කිරීමෙන් පසු නිකුත් කරනු ලබන අතර, ඉහත සබැඳිය (Link) මගින්ද බාගත කළ හැක.

4. ඉහත සේවාවන් සැපයීමට කැමැත්තක් දක්වන්නේ නම් නිසි පරිදි පුරවන ලද ලංසු ලේඛන සහ සියලු අදාළ තොරතුරු ලියුම් කවරයක බහා මුද්‍රා තබා සහකාර සාමාන්‍යාධිකාරී (ටෙන්ඩර් සහ කොන්ත්‍රාත්) , ජා.ජ.හා.ජ.ම. ගාලුපාර. රත්මලාන යන ලිපිනයට 2024 අගෝස්තු 26 වැනි දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනැවිත් භාරදීම සිදුකළ හැක.

5. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. උනන්දුවක් දක්වන පුද්ගලයින්, සහකාර සාමාන්‍යාධිකාරී (ටෙන්ඩර් සහ කොන්ත්‍රාත්) අංශය මගින් දුරකථන අංක 011-2605328 දිගුව 1750 ඔස්සේ හෝ ෆැක්ස් අංකය 011-2635885 මගින් වැඩිදුර විස්තර ලබාගත හැකි අතර, සම්පූර්ණ සවිස්තර පත්‍රිකා සහකාර සාමාන්‍යාධිකාරී (ටෙන්ඩර් සහ කොන්ත්‍රාත්) , ජා.ජ.හා.ජ.ම. ගාලුපාර. රත්මලාන හිදී නොමිලේ පරීක්ෂා කළ හැකිය.

7. පෙර ලංසු රැස්වීම 2024/08/16 දින පෙ.ව. 10.00ට ජලය සහ සනීපාරක්ෂාව සඳහා වූ විශිෂ්ටතා මධ්‍යස්ථානය (CEWAS) හිදී පැවැත්වේ.

**සභාපති,**
**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය.**